# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

**නාට්‍ය හා රංග කලාව** | **11 ශ්‍රේණිය** | කාලය පැය එකයි

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

☺ **පහත සඳහන් පද්‍ය ඇසුරින් අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

I. වලට ගොස් මපියාණනි උතුම්
කිසි දිනක පෙරළා නොආවොත්
මේ ලෙනේ සිරවී සිටින්නා
බැහැර යන්නට මග නොදන්නා

II. ඉදින් බබෝ ඉදින් - මගේ අතේ ඉදින්
බොහෝ ආදරෙන් නුඹේ මව මෙන් - රකින්නෙමි මෙමං

III. සිරසටා ගෙතු මල් වඩම්
හිස මතු පිටා දිලි තෙලයෙන්
සුවඳටා මල්වල එරොන්
ගෙන යන්නට එති කැළ බිඟුන්

IV. මෙම ගිම්හාන ග්‍රීෂ්ම වූ කාලේ
අපේ උද්‍යානෙ ක්‍රීඩා සැපා වේ

1. නූර්ති නාට්‍යකට අයත් පද්‍ය ඛණ්ඩය වන්නේ
   i. I ය   ii. II ය   iii. III ය   iv. IV ය

2. පහතරට කෝළම් ජන නාටකයකට අයත් පද්‍ය වන්නේ
   i. I ය   ii. II ය   iii. III ය   iv. IV ය

3. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් නිර්මාණය කරන ලද නාට්‍යයකට අයත් පද්‍ය වන්නේ
   i. I ය   ii. II ය   iii. III ය   iv. IV ය

4. නාඩගම් වලට අයත් පද්‍ය වන්නේ
   i. I ය   ii. II ය   iii. III ය   iv. IV ය

5. සදාතනික පිය පුතු අරගලය තේමා කොටගත් නාට්‍ය අයත් පද්‍ය වන්නේ
   i. I ය   ii. II ය   iii. III ය   iv. IV ය

☺ **ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි වරණය තෝරන්න.**

6. නාට්‍ය නිෂ්පාදනයකදී වේදිකාව මත මැවෙන ප්‍රේක්ෂාව පිළිබඳ වගකීම භාරව සිටින්නේ
   i. පසුතල නිර්මාණ ශිල්පියාය   ii. රංගාලෝක ශිල්පියාය
   iii. රංග භූමි පාලකයාය   iv. අංගරචනා ශිල්පියාය

7. අභිරූපණයකදී බාහිර ශිල්ප ක්‍රමය යනු
   i. මනසින් නිර්මාණය කරගත් සිද්ධිය සිරුර උපයෝගී කරගෙන ඉදිරිපත් කිරීමයි.
   ii. රංගනයට අදාල කරගත් සිද්ධිය සිරුර උපයෝගී කරගෙන ඉදිරිපත් කිරීමයි
   iii. සහජ කුසලතාව මත ඉදිරිපත් කිරීමකි
   iv. සිටින අවකාශය තුළ විවිධ අයුරින් ගමන් ක්‍රම යොදා ගනිමින් ආංගික හා සාත්වික අභිනය ගෙනහැර පෑමයි.

8. නූර්ති නාට්‍ය පෙන්වීම සඳහාම නිර්මාණය වූ රඟහල වන්නේ
   i. ලයනල් වෙන්ට් රඟහල
   ii. ජේන් ද සිල්වා සමරු රඟහල
   iii. ටවර් රඟහල
   iv. එල්පිනිස්ටන් රඟහල

9. මුල්ම සිංහල නාඩගම වන්නේ
   i. රෝමියෝ ජුලියට්
   ii. පණ්ඩුකාභය
   iii. රාමායණය
   iv. ඇහැලේපොළ

10. ලෝකධර්මී නාට්‍ය පමණක් දැක්වෙන වරණය වන්නේ
   i. ප්‍රේමතෝ ජායතී සෝකෝ, පබාවතී, නරිබෑනා, කැලණි පාලම
   ii. කැලණි පාලම, මෝදර මෝල, අහසින් වැටුනු මිනිස්සු, තලමල පිපිලා
   iii. මනමේ, තට්ටු ගෙවල්, හරිම බඩු හයක්, කුවේණි
   iv. ජනේලය, සිංහබාහු, දුන්න දූනුගමුවේ, රත්තරං

☺ **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| ක | ග | ජ | ට |
|---|---|---|---|
| යක්කම්<br>ගුරුගේ මාලාව<br>ගබඩා කොල්ලය | අඹවිදමන<br>මරා ඉපැද්දීම | කපුයක් කාරිය<br>දරු නැළවිල්ල<br>දෙළහ පෙළ පාළිය | ආලවක දමනය<br>මිලින්ද ප්‍රශ්නය<br>දෙරකඩ අස්න |

11. සබරගමු ප්‍රදේශයේ ශාන්තිකර්මවල දක්නට ලැබෙන නාට්‍යමය අවස්ථා ඇතුළත් කාණ්ඩය වන්නේ
   i. 'ක' ය   ii. 'ග' ය   iii. 'ජ' ය   iv. 'ට' ය

12. ගර්භ සංරක්ෂණය මුල්කරගත් ශාන්තිකර්මයකට අයත් නාට්‍යමය ලක්ෂණ ඇතුළත් කාණ්ඩය වන්නේ
   i. 'ක' ය   ii. 'ග' ය   iii. 'ජ' ය   iv. 'ට' ය

13. ශාන්තිකර්ම නොවන පූජාකර්ම ඇතුළත් කාණ්ඩය වන්නේ
   i. 'ක' ය   ii. 'ග' ය   iii. 'ජ' ය   iv. 'ට' ය

14. උඩරට ශාන්තිකර්මයකට අයත් නාට්‍යමය අවස්ථා ඇතුළත් කාණ්ඩය වන්නේ
   i. 'ක' ය   ii. 'ග' ය   iii. 'ජ' ය   iv. 'ට' ය

15. පත්තිනි දේවිය හා සම්බන්ධ නාට්‍යමය අවස්ථා ඇතුළත් කාණ්ඩය වන්නේ
   i. 'ක' ය   ii. 'ග' ය   iii. 'ජ' ය   iv. 'ට' ය

☺ **පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් අංක 16 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | | | |
|---|---|---|---|
|  |  |  |  |
| ක | ග | ජ | ට |

16. සොඳුරු ආඟුඳයකයා හෙවත් නාට්‍ය නිෂ්පාදකයා කෘතිය රචනා කළ නාට්‍ය ශිල්පියා දැක්වෙන ඡායාරූපය වන්නේ

i. 'ක' ය　ii. 'ග' ය　iii. 'ජ' ය　iv. 'ට' ය

17. ගුරුතරුව නාට්‍යයේ නිර්මාණකරු දැක්වෙන ඡායාරූපය වන්නේ

i. 'ක' ය　ii. 'ග' ය　iii. 'ජ' ය　iv. 'ට' ය

18. මෙහි 'ජ' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ

i. සුගතපාද ද සිල්වා
ii. පරාක්‍රම නිරිඇල්ල
iii. ජයලත් මනෝරත්න
iv. ආර්. ආර්. සමරකෝන්

19. මෙහි 'ට' ඡායාරූපයෙන් දැක්වෙන නාට්‍යකරු වන්නේ

i. ජයලත් මනෝරත්න
ii. සයිමන් නවගත්තේගම
iii. ගාමිණී හත්තොටුවේගම
iv. සුගතපාල ද සිල්වා

20. "ජේලර් උන්නැහේ හා කපුටුබෝ" යන නාට්‍ය ද්විත්වය නිර්මාණය කළ ශිල්පියා දැක්වෙන ඡායාරූපය වන්නේ

i. 'ක' ය　ii. 'ග' ය　iii. 'ජ' ය　iv. 'ට' ය

**☺ අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර තෝරන්න.**

21. ජනප්‍රිය නූර්ති රචකයා වූයේ

i. චාල්ස් ඩයස් ය
ii. සී. දොන් බස්තියන්ය
iii. ජෝන් ද සිල්වා ය
iv. පිලිප්පු සිඤ්ඤෝ ය

22. නාඩගම්වල ස්ථාවර පාත්‍රයෙක් නොවන්නේ

i. බහුභූතයා　ii. හඬදූතයන්　iii. සොන්තානා　iv. සෙල්ලම ළමා

23. අනුකරණය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ

i. වෙනත් පුද්ගල චරිතයක්, ක්‍රියාවක් ඒ අයුරින්ම කර පෙන්වීම
ii. අනුකරණය සත්වයන්ගේ ද ප්‍රාථමික සමාජයේද පවතී
iii. පූජාකර්ම හා ශාන්තිකර්ම වලදී අනුකරණය ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ
iv. නාට්‍යයේදී අනුකරණය නිර්මාණාත්මක නොවිය යුතුය

24. නාට්‍යයක ගැටුම සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ

i. නාට්‍යය ගැටුම එහි කතා පුවත තුළින්ම ක්‍රමිකව විකාශනය වේ
ii. ගැටුම මිනිසා මිනිසා සමඟ මෙන්ම සමාජය හා පරිසරය සමඟ ද ඇතිවේ
iii. ගැටුමක් තුළ කුතුහලය ඇතිවූ නමුත් ආතතිය ඇති නොවේ
iv. ගැටුමක් බාහිරව හා අභ්‍යන්තරව ඇතිවිය හැක

25. විශේෂ රංගාලෝක උපකරණයක් අඩංගු නොවන වරණය වන්නේ

i. මිරබෝල්, අල්ට්‍රාවයලට් පහන, බබ්ල් මැෂින්, ඩිමරය
ii. අල්ට්‍රාවයලට් පහන, ලිනේ බැච් යන්ත්‍රය, බබ්ල් මැෂින්, ප්‍රොජෙක්ටරය
iii. මිරබෝල්, බබ්ල් මැෂින්, යොමු පහන, ලිනේ බැච් යන්ත්‍රය
iv. අල්ට්‍රාවයලට් පහන, බබ්ල් මැෂින්, ප්‍රොජෙක්ටරය, ඩිමරය

☺ **පහත දැක්වෙන වගුව ඇසුරින් අංක 26 සිට 30 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| **නාට්‍යයේ නම** | **රචකයාගේ නම** | **පරිවර්තනය/ අනුවර්තනය** | **මෙරට නිෂ්පාදක** |
|---|---|---|---|
| වෙයිටිං ෆෝ ගෝඩෝ | සැමුවෙන් බෙකට් | ගෝඩෝ එනකං | **ක** |
| ඉක්නෙව්ටාඉ | **ග** | බෙර හඬ | බන්ධුල ජයවර්ධන |
| **ජ** | ටෙනසි විලියම් | අහස් මාලිගා | හෙන්රි ජයසේන |
| මර්චන්ට් ඔෆ් වෙනිෂ් | විලියම් ෂේක්ෂ්පියර් | **ට** | බන්ධුල විතානගේ |
| දි එල්ඩර් සන් | ඇලෙක්සැන්ඩර් වැම්පිලෝව් | පුත්‍ර සමාගම | **ඩ** |

26. ඉහත වගුවේ "ක" කොටුවට ඇතුළත් නිය යුතු මෙරට නිෂ්පාදකගේ නම කුමක්ද?
    i. සුගතපාල ද සිල්වා
    ii. ජේ.ඒ. සෙල්වදෙරේ
    iii. හෙන්රි ජයසේන
    iv. බන්ධුල විතානගේ

27. ඉහත වගුවේ "ග" වෙනුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක්ද?
    i. හෙන්රි ඉබ්සන්
    ii. ටෙනසි විලියම්
    iii. සොෆොක්ලීස්
    iv. ප්ලොටස්

28. ඉහත වගුවේ "ජ" වෙනුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?
    i. චෙරිඔර්චාර්ඩ්
    ii. යෙර්මා
    iii. රන් පෝ යුවර් වයිෆ්
    iv. ග්ලාස් මෙනාජරි

29. ඉහත වගුවේ "ට" කොටුවට ඇතුළත් විය යුතු නාට්‍යයේ නම කුමක්ද?
    i. වැනීසියේ වෙළෙන්ද
    ii. ජන හතුරා
    iii. පැන්ස තුනේ කථාව
    iv. සයුරෙන් ආ ළඳ

30. ඉහත වගුවේ "ඩ" කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය ශිල්පියා වන්නේ
    i. සිරිල් සී පෙරේරා
    ii. ජයලත් මනෝරත්න
    iii. ප්‍රසන්න විතානගේ
    iv. බන්ධුල විතානගේ

☺ **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට නොගැලපෙන වරණය තෝරන්න.**

31. රංග භූමි අලංකරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ
    i. එය හුදු සැරසිල්ලක් වන අතර රංගභූමිය අලංකාරවත් කරන්නකි
    ii. නාට්‍ය පෙළෙන් කියැවෙන දේශයටල තාලයටල යුගයට ගැලපිය යුතුය
    iii. රංගභූමි අලංකරණ සංකේතාත්මකව ඉදිරිපත් කළ හැකිය
    iv. ජීවමාන නළු නිළියන් යොදා ගැනීමෙන් ද රංගභූමි අලංකරණ සිදුකළ හැකිය

32. නාට්‍ය කලාවෙහි ප්‍රේක්ෂක සහභාගීත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී
    i. නාට්‍යයක් නැරඹීම සඳහා විශේෂයෙන් සූදානම්ව පැමිණෙන පුද්ගලයා ප්‍රේක්ෂකයා වේ
    ii. ප්‍රේක්ෂකයා යනු නාට්‍යයකට අත්‍යාවශ්‍ය පුද්ගලයෙකු නොවේ
    iii. ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයක ඉදිරි ගමන තීරණය කරයි
    iv. ප්‍රේක්ෂකයා විචාරකයෙකු, රසිකයෙකු හා විනිශ්චකරුවෙකු ද වේ

33. ක්ෂණික නිරූපණයකදී
    i. නාට්‍ය පිටපතක් තිබීම අත්‍යාවශ්‍ය නොවේ
    ii. පරිකල්පනය මෙහෙයවන ප්‍රතිනිර්මාණය කළ හැකිය
    iii. රංග භාණ්ඩ භාවිතා කළ නොහැකිය
    iv. කේවලව හා සාමූහික වශයෙන් ඉදිරිපත් කල හැකිය

34. වේෂභූෂණ යනු නාට්‍ය නිර්මාණයකදී යොදා ගන්නා වැදගත් අනුෂාංගික කලාවකි
   i. වේෂභූෂණ අභ්‍යන්තර හා බාහිර සමාරෝපයට වැදගත් වේ
   ii. නාට්‍යයේ ශෛලිය, කාලය, දේශය, යුගය, චරිත පිළිබඳව සලකා නිර්මාණය කළ යුතුය
   iii. වේෂ භූෂණ නිර්මාණ ශිල්පියාට අභිමත පරිදි එය කළ හැකිය
   iv. පසුතල, රංගෝපකරණ සමඟ ගැළපිය යුතුය

35. රංගාලෝකය
   i. නළුවන් පැහැදිලිව දැකගැනීමට උපකාරී වේ
   ii. නාට්‍යයේ ශෛලිය ඉස්මතු කිරීමට ඉවහල් වේ
   iii. කිසියම් දර්ශනයකින් ඉස්මතුවන භාවය තීව්‍ර කිරීමට සමත් වේ
   iv. කිසියම් දර්ශනයක් සිදුවන කාල වේලාව දැක්වීමට උපකාරී වේ

**☺ පහත දැක්වෙන වෙස්මුහුණු දෙක ආශ්‍රයෙන් 36 හා 37 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
|  |  |
| ක | ග |

36. මෙහි දැක්වෙන වෙස් මුහුණු දෙක
   i. "ක" සන්නි මුහුණකි "ග" කෝළම් මුහුණකි
   ii. "ක" කෝළම් මුහුණකි "ග" සන්නි මුහුණකි
   iii. "ක" හා "ග" සන්නි කෝළම් මුහුණු දෙකකි
   iv. "ක" හා "ග" සන්නි සන්නි මුහුණු දෙකකි

37. මෙම වෙස් මුහුණු දෙකින් නිරූපණය වන්නේ
   i. මුදලි කෝළම හා ජස කෝළමයි
   ii. පොලිස් කෝළම හා වාත සන්නියයි
   iii. වෙඩි සන්නිය හා පිස්සු සන්නියයි
   iv. මුදලි කෝළම හා අමුක්කු සන්නියයි

**☺ අංක 38 සිට 40 තෙක් ප්‍රශ්න වලට ගැළපෙන වරණය තෝරන්න.**

38. පෙරදිග නාට්‍ය කලාව සම්බන්ධයෙන් රචිත "නාට්‍ය ශාස්ත්‍රය" හා බටහිර නාට්‍ය කලාව සම්බන්ධයෙන් රචිත "කාව්‍ය ශාස්ත්‍රය" කෘති දෙක රචනා කළ රචකයින් වන්නේ
   i. භරතමුනි හා අභිනවගුප්ත
   ii. අභිනව ගුප්ත හා ප්ලේටෝ
   iii. ඇරිස්ටෝටල් හා ශ්‍රී හර්ෂ
   iv. භරතමුනි හා ඇරිස්ටෝටල්

39. පහත සඳහන් රංගභූමි අතරින් ලෝකයේ පැරණිම රංගභූමිය ලෙස සැලකෙන්නේ
   i. ප්‍රොසීනියම් ආරුක්කු වේදිකාව
   ii. කරළිය
   iii. ග්‍රීක වේදිකාව
   iv. ග්ලෝබ් වේදිකාව

40. මුද්‍රා නාට්‍යය, බැලේ නාට්‍යය, ගීත නාට්‍යය, ඔපෙරා යන කලාවෙන් පිළිවෙලින් දැක්වෙන වරණය වන්නේ
   i. කරදිය, නලදමයන්ති, අග්නි, දෙපානෝ
   ii. නල දමයන්ති, හංසවිල, දෙපානෝ, අග්නි
   iii. චණ්ඩාලිකා, දෙපානෝ, ස්ලීපිං බියුටි, රතු එළිය
   iv. දෙපානෝ, සාප්මෝචන්, නට්ක්‍රැකර්, මානසවිල

## II කොටස

☺ **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. විකෘති නාට්‍ය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   i. විකෘති නාට්‍යයේ තේමාව කුමක්ද? (ල 2)
   ii. මෙම නාට්‍යයේ දක්නට ලැබෙන චරිත 3 ක් සඳහන් කරන්න. (ල 2)
   iii. ප්‍රියංගනීගේ ප්‍රියතම විෂය කුමක්ද? (ල 2)
   iv. ප්‍රියංගනීගේ මවගේ අපේක්ෂාව ප්‍රියංගනී කුමන වෘත්තියක නියැලෙනාවා දැකීමද? (ල 2)
   v. විකෘති නාට්‍ය නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද? (ල 2)
   vi. මෙම නාට්‍යය ප්‍රථම වරට රංග ගතවූ වර්ෂය කුමක්ද? (ල 2)

2.
   i. රංගාලෝකය යන්න පහදන්න. (ල 2)
   ii. රංගාලෝක උපකරණ 4ක් නම් කරන්න. (ල 4)
   iii. ඔබ නැරඹූ නාට්‍යයක තේමාව තීව්‍ර කිරීම සඳහා රංගාලෝකය යොද තිබූ ආකාරය විස්තර කරන්න. (ල 6)

3.
   i. පහතරට ප්‍රදේශයට අයත් ගැමි නාටකය නම් කරන්න. (ල 2)
   ii. එම ගැමිනාටකය රඟ දක්වන රංග භූමිය ඇඳ එහි කොටස් නම් කරන්න. (ල 4)
   iii. මෙම ගැමි නාටක සම්ප්‍රදයේ රංග ශෛලිය විස්තර කරන්න. (ල 6)

4.
   i. විදි නාට්‍ය කලාවට පුරෝගාමී මෙහෙවරක් කළ නාට්‍ය ශිල්පියා නම් කරන්න. (ල 2)
   ii. ඔහුගේ නිර්මාණ 4ක් ලියන්න. (ල 4)
   iii. එම ශිල්පියා විසින් නාට්‍ය කලාවට කළ මෙහෙවර පහදන්න. (ල 6)

5.



   i. මෙම රංගභූමියෙහි රඟ දැක්වූ නාට්‍ය විශේෂය නම් කරන්න. (ල 2)
   ii. එම නාට්‍ය නිර්මාණය කළ ශිල්පීන් දෙදෙනෙකු හා ඔවුන්ගේ නිර්මාණ දෙකක් ලියන්න. (ල 4)
   iii. එම නාට්‍ය විශේෂයෙහි රංග ශෛලිය විස්තර කරන්න. (ල 6)

6.
   i. සමාරෝපය යනු කුමක්ද? (ල 2)
   ii. සමාරෝපය ප්‍රභේද නම් කර එය කෙටියෙන් හඳුන්වන්න. (ල 4)
   iii. සමාරෝපය සාර්ථක කරගැනීම සඳහා අනුෂාංගික අංග භාවිතය ඉවහල් කර ගන්නා ආකාරය නරඹන ලද නාට්‍යයක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල 6)

7. පහත දැක්වෙන අවස්ථාව පාදක කරගනිමින් කෙටි නාට්‍යයකට සුදුසු පෙළරචනයක් කරන්න.

නිමල් තම යහළුවන් සෙල්ලම් කිරීමට පැමිණෙන තෙක් බෝලය උඩ දමා ඊට බැට් එකෙන් ගසමින් සිටී. එක්වරම ඔහු උඩ දමා ගැසූ බෝලය අසල නිවසක ජනේලයේ වීදුරුව බිඳගෙන නිවස ඇතුළට යයි. බයට පත් නිමල් වහා සැඟවෙයි. ගෙහිමි කාන්තාව බෝලය රැගෙන එළියට පැමිණ බලන විට ඇයගේ ගේ අසලින් බැට් එකක් අතැතිව අමල් ගමන් කරමින් සිටී.

i. නාට්‍යෝචිත අවස්ථා නිර්මාණය (ල 4)

ii. සංවාද හා රංග නිධාන සහිතව පෙළ රචනය (ල 8)